සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

23 | S | I

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

**Third Term Test - Grade 12 - 2018**

විභාග අංකය .............................

# දේශපාලන විද්‍යාව I

කාලය පැය දෙකයි

- **1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට (1,2,3,4,5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගෙන ලකුණු කරන්න.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

❖ **අංක 1-20 තෙක් ප්‍රශ්න සඳහා ප්‍රශ්නයේ මාතෘකාවට අදාළව ප්‍රකාශ පහක් දක්වා ඇත. සත්‍ය ප්‍රකාශ කණ්ඩය තෝරන්න.**

01. දේශපාලනය
    1. සමාජ ජීවිතයේ අනිවාර්ය අංගයකි.
    2. මිනිස් ජීවිතය සමඟ සම්බන්ධ වී තිබේ.
    2. ක්‍රියාවට නැංවෙන ඒකකය රාජ්‍යයයි.
    4. සම්පූර්ණයෙන්ම බල අරගලයක් පමණකි.
    5. ජාතික හා ජාත්‍යන්තර ක්‍රියාවලියකි.

02. දේශපාලන අධ්‍යයනය
    1. පරිපූර්ණ ලෙසම ස්වාභාවික විද්‍යාවකි.
    2. ආරම්භ වන්නේ ග්‍රීක යුගයේදීය.
    3. රාජ්‍ය කේන්ද්‍රීය විෂයක් ලෙස අධ්‍යයනය කරයි
    4. නූතන යුගයේ දී පුළුල් විය.
    5. ප්‍රවේශ ගණනාවක් ඔස්සේ සිදුකරයි.

03. දේශපාලනය කිරීම,
    1. ආණ්ඩු බලය ලබා ගැනීමට ක්‍රියාකාරී වීමයි.
    2. සටන් හා විරෝධතා ව්‍යාපාර මුලිනුපුටා දැමීමයි.
    3. මැතිවරණ වලට සහභාගිවීමයි.
    4. ආණ්ඩු බලය ක්‍රියාත්මක කිරීමයි.
    5. දේශපාලන පක්ෂවල ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වීමයි.

04. දාර්ශනික ප්‍රවේශය,
    1. සම්ප්‍රදායිකව යොදාගත් ප්‍රවේශයකි.
    2. ආරම්භ කළේ සොක්‍රටීස් හා ප්ලේටෝ විසිනි.
    3. සෑම යුගයකම දේශපාලන අධ්‍යයනයට යෙදවීය.
    4. නිර්මාණය කළේ සියල්ල අති මූලික ලෙස ප්‍රශ්න කිරීමෙනි.
    5. ප්‍රත්‍යක්ෂ මූලික දැනුම මතම පදනම වී ගොඩනංවන ලද්දකි.

05. තුලනාත්මක ප්‍රවේශය,
    1. සම්පූර්ණයෙන්ම නවතම ප්‍රවේශයකි.
    2. වඩා යතාර්ථවාදී ප්‍රවේශයකි.
    3. මුලින්ම යෙදාගත්තේ ඇරිස්ටෝටල් විසිනි.
    4. විසිවන සියවසේදී වඩාත් විද්‍යාත්මක විය.
    5. වර්තමානයේදී වඩාත් පුළුල්ව යොදාගනු ලබයි.

06. බහු විෂයික ප්‍රවේශය,
1. වෙනත් විෂයන්ගේ න්‍යායන් හා විධික්‍රම දේශපාලන අධ්‍යයනයට යොදවයි.
2. අවශ්‍ය වන්නේ දේශපාලනය සමාජයේ අනෙකුත් පැතිකඩ වලින් වියුක්තව පවතින නිසාය.
3. දේශපාලනය බැඳී තිබෙන අනෙකුත් පැතිකඩ අධ්‍යයනයට අත්‍යාවශ්‍ය වෙයි.
4. අවශ්‍ය වන්නේ දේශපාලනයේ පවතින විස්තිරණ දිශානතින් නිසාය.
5. ගොඩනැගුනේ අතීතයේ පටන් දේශපාලනය වෙනත් විෂයන් ගණනාවක් සමඟ බැඳී වර්ධනය වූ නිසාය.

07. අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය,
1. මූලික වශයෙන් මාක්ස්වාදය සමඟ බැඳී තිබේ.
2. 18 වැනි සියවසේ ධනවාදී ආර්ථිකයේ වර්ධනය සමඟ බැඳී ගොඩනැගුණි.
3. භාවිතයේ දී මාක්ස් සමාජය ව්‍යුහය හා උපරි ව්‍යුහය ලෙස බෙදා දක්වයි.
4. මූලික වශයෙන් ආර්ථිකය හා දේශපාලනය අතර සම්බන්ධය ප්‍රතික්ෂේප කරයි.
5. දේශපාලනයේ වෙනස්වීම සඳහා පංති සහ පංති අරගලයේ බලපෑම විග්‍රහ කරයි.

08. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය,
1. දේශපාලන තින්දු වලට බලපාන සමාජීය සාධක සොයා බලයි.
2. වර්ධනය වන්නේ 19 වන හා විසිවන සියවස් වලදීය
3. මැක්ස්වෙබර් හා කාල්මාක්ස්ගේ බලපෑමෙන් තොරවී ඇත.
4. ආර්ථික සාධකයට අමතරව වෙනත් සමාජීය සාධක වෙතද අවධානය යොමුකරයි.
5. ධනය, බලය, ලිංගිකත්වය ආදී සාධක වල දේශපාලන බලපෑම සොයා බලයි.

09. ස්ත්‍රීවාදී ප්‍රවේශය,
1. රැඩිකල්වාදී අධ්‍යයන ප්‍රවේශයකි.
2. සම්ප්‍රධායානුකූල අධ්‍යයන විධි ක්‍රමයකි.
3. දේශපාලනයේ අර්ථය වඩා වර්ධනය කරයි.
4. දේශපාලනයේ සම්ප්‍රදායික විග්‍රහය ප්‍රශ්න කිරීමට ලක් කළේය.
5. ස්ත්‍රී විමුක්තිය වෙනුවෙනි.

10. දේශපාලන විද්‍යා විෂය ක්ෂේත්‍රය,
1. සමස්ථයක් ලෙස දේශපාලනය සමඟ බැඳී තිබේ.
2. උප විෂය ක්ෂේත්‍ර ගණනාවකට බෙදිය හැකිය.
3. න්‍යාය, දර්ශනය, මතවාද හා දේශපාලන ආයතන යන තේමා වලින් යුක්තය.
4. සීග්‍රයෙන් වර්ධනය වන්නේ ග්‍රීක යුගයේදීය.
5. අතිශයින් පුලුල් වන්නේ නූතන යුගයේදීය.

11. දේශපාලන න්‍යාය
1. සංක්ෂිප්ත කළ විධිමත් දැනුමකි.
2. ප්‍රතිමානිය හා විද්‍යාත්මක ලෙස බෙදෙයි.
3. කිසිසේත්ම භාවිතයට සමීප නොවේ.
4. දේශපාලන ගැටළු විග්‍රහ කිරීමට ආලෝකයක් සපයයි.
5. විවිධ දේශපාලන ක්ෂේත්‍ර ආශ්‍රිතව ගොඩනැංවී ඇත.

12. දේශපාලන ආයතන,
1. මූලික වශයෙන් රාජ්‍ය හා ආණ්ඩුව මත පදනම් වෙයි.
2. සියල්ල අවිධිමත්ව සංවිධාන වෙයි.
3. අධ්‍යයනය විධිමත් නෛතික ස්වරූපයෙන් ද ගොඩනැංවී තිබේ.
4. අධ්‍යයනය සමාජීය විද්‍යාවල ප්‍රධාන තේමාවකි.
5. ධූරාවලිගත නිලබල ආකෘතියකින් යුක්ත වෙයි.

13. ව්‍යස්ථාදායකය,
    1. ආණ්ඩුවේ නියෝග ක්‍රියාත්මක කරනු ලබයි.
    2. රටක සාමාන්‍ය හා මූලික නීතියේ ස්වභාවය තීන්දු කරයි.
    3. ප්‍රජාතන්ත්‍රවාදයේ දී ජනතා නියෝජිත ආයතනයයි.
    4. සමහර ආණ්ඩුවල ද්වි මාණ්ඩලික වෙයි.
    5. ආණ්ඩුවක විශාලතම නියෝජිත ආයතනයයි.

14. විධායකය
    1. රටක නීති විශ්ලේෂණය කරයි.
    2. ව්‍යවස්ථාදායකට සාපේක්ෂව කුඩා ආයතනයකි.
    3. අමාත්‍යංශ - දෙපාර්තමේන්තු - රාජ්‍ය සංස්ථා මගින් ප්‍රතිපත්ති ක්‍රියාවට නංවයි.
    4. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයකදී කැබිනට් මණ්ඩලයයි.
    5. කාර්යක්ෂම එකක් විය යුතු වෙයි.

15. දේශපාලන පක්ෂ,
    1. ආණ්ඩු බලය ලබාගැනීම උදෙසා බිහිකළ ජනතා සංවිධානයන්ය.
    2. මැතිවරණ මගින් පමණක් ආණ්ඩුබලය ලබාගැනීමට වෙහෙසෙන සංවිධානයකි.
    3. කේඩර හා ජනතාවාදී ලෙස වර්ග වෙයි.
    4. මහජනයා හා ආණ්ඩුව යා කරන පාලමක් ලෙස සැලකිය හැක.
    5. ප්‍රජාතන්ත්‍රවාදයේ අත්‍යාවශ්‍ය පූර්ව කොන්දේසියකි.

16. බලපෑම් කණ්ඩායම්
    1. ආශා කණ්ඩායම් ලෙසද හඳුන්වනු ලබයි.
    2. ලොබි කණ්ඩායම් ලෙසද ක්‍රියාත්මක වෙයි.
    3. ආණ්ඩුබලය උදසො කටයුතු කරයි.
    4. ප්‍රවර්ධනකාරී කාර්යභාරයක් ඉෂ්ඨ කරයි.
    5. ජනතා අභිලාෂ නියෝජනය කරයි.

17. සිවිල් සමාජය
    1. සංවිධිත දේශපාලන සමාජයයි.
    2. ප්‍රජාතන්ත්‍රවාදය උදෙසා සක්‍රීය විය යුතු වෙයි.
    3. අධිකාරිවාදී රාජ්‍යයන් වලදී අක්‍රිය වෙයි.
    4. සිවිල් පුරවැසියන්ගේ දේශපාලන සහභාගිත්වය වර්ධනය කරයි.
    5. සක්‍රීය වීම ප්‍රජාතන්ත්‍රවාදයට බාධකයකි.

18. දේශපාලන චින්තනය,
    1. සෑම යුගයකදීම සමාන අදහස්වලින් පෝෂණයවෙයි.
    2. යුගයට සාපේක්ෂව ගොඩනැගෙයි.
    3. වෙනස් වෙමින් යලි ගොඩනැගෙමින් පවතියි.
    4. සමාජ පදනමේ ප්‍රතිබිම්බයකි.
    5. න්‍යාය හා දර්ශනයන් වලින් යුක්තවෙයි.

19. දේශපාලන දර්ශනය
    1. සංකල්ප වලට අර්ථ ලබාදෙයි.
    2. පරම ආකෘති ගොඩනංවයි.
    3. දේශපාලනය ගැන අති මූලික ප්‍රශ්න මතු කරයි.
    4. ප්‍රතිමානිය අගයන් ඉලක්ක කරයි.
    5. ඒක මාර්ගික විකල්ප ඉදිරිපත් කරයි.

20. දේශපාලන මතවාද
    1. මිනිසුන්ගේ හැසිරීම තීන්දු කිරීමට බලපානු ලබයි.
    2. වෙනුවෙන් මිනිසුන් සිය ජීවිතයද කැපකරයි.
    3. කිසි විටෙකත් ප්‍රචාරණය නොකරයි.
    4. න්‍යායන් හා දර්ශනයන් ආශ්‍රිතව ද ගොඩනැගෙයි.
    5. මිනිසුන්ගේ දේශපාලන උනන්දුව වර්ධනය කිරීමට බලපානු ලබයි.

❖ **අංක 21 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් 04 ක් පමණක් නිවැරදි වෙයි. නිවැරදි පිළිතුරු කාණ්ඩය දක්වන්න.**

21. රාජ්‍යය

A ප්‍රායෝගිකව දේශපාලනය ක්‍රියාවට නැංවෙන ඒකකයයි.

B මිනිසාගේ අභ්‍යන්තර ජීවිතය පාලනය කරයි.

C සමාජයට ආරක්ෂාව හා ප්‍රගතිය ලබාදෙන උත්තරීතර සංවිධානයයි.

D සියළු මානව සංවිධාන අතර ඉහළම සංවිධානයයි.

E ප්‍රධාන අංග ලක්ෂණ ගණනාවකින් යුතු සමස්ත ප්‍රපංචයයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

22. රාජ්‍යයේ කාර්යභාරය,

A ආණ්ඩුවේ කාර්යභාරයට සමපාත වෙයි

B සම්ප්‍රදායිකව ත්‍රිවිධබල ආයතන වල කාර්යයක් ද වෙයි.

C අයබදු එකතු කිරීමට සීමාවෙයි.

D රටේ ආරක්ෂාව හා සමාජ ප්‍රගතිය තීන්දු කරයි.

E වෙනස් වෙමින් යළි ගොඩනැගෙමින් පවතීයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

23. දේශපාලනය බල ආයතනයක් ලෙස රාජ්‍ය,

A ඉහළම මානව සංගමයයි

B දේශපාලන සාමුහිකත්වයේ කේන්ද්‍රීය ප්‍රකාශනයයි.

C ස්වාධිපති බලයේ එකම හිමිකරුවායි.

D ප්‍රචන්ඩත්වයේ එකාධිකාරීත්වය නියොජනය කරයි.

E අන්‍ය සමාගම් වල පාලනයට යටත් වෙයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

24. රාජ්‍යයක භෞමික පදනම

A නූතන ජාතික රාජ්‍යයේදී නිශ්චිතය.

B කෘතිමව හෝ ස්වභාවිකව නිර්මානය වී ඇත.

C සමාන භූගෝලීය ඒකක වලින් නිර්මාණය වෙයි.

D සාපේක්ෂ වශයෙන් දැනට අනම්‍ය වී ඇත.

E ගොඩබිම මුහුදු හා ගුවන් සීමාවලින් යුක්තය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

25. නූතන ජාතික රාජ්‍ය,

A ධනවාදී ආර්ථිකය මත පදනම් විය

B වැඩවසම් ආර්ථිකය මත පදනම් විය.

C එක් ජාතියක් නියෝජනය කරයි

D කිසි විටෙකත් බහුවාර්ගිකත්වය නියෝජනය නොකරයි.

E මධ්‍යගතවාදය හා නිලබල ක්‍රමය මත පදනම් වෙයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

26. ගෝලීයකරණය

A ධනවාදයේම වර්ධනීය අවස්ථාවකි

B ප්‍රාග්ධනය ජාත්‍යන්තරීකරණය වීමකි.

C ජාතික දේශ සීමා නොතකා ආර්ථිකය ලෝකය පුරා දුවපැන ඇවිදීමකි.

D සිය සංස්කෘතික මුහුණුවර බවට පත්කලේ විශ්ව ගම්මානයයි.

E වැඩවසම් ස්වයංපෝෂිතභාවයේ ඉදිරි පියවරකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

27. ගෝත්‍රික රාජ්‍ය

A කුඩා සරල සම්ප්‍රදායික රාජ්‍ය මාදිලියකි.

B බලය ගෝත්‍රයේ වරිගයකට උරුම විය.

C නායකයාගේ බලය අසීමිතය

D නායක මණ්ඩලය බොහෝ ගෝත්‍රවල වරිග සභාවකි.

E දේශපාලනය පුද පූජා අභිචාර විධිමත පදනම් විය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

28. ග්‍රීක පෞර රාජ්‍යය,

A කුඩා නාගරික රාජ්‍ය වර්ගයකි

B එකිනෙක සමඟ ඒකාබද්ධ රාජ්‍ය සංගමයකි.

C විවිධ දේශපාලන මාදිලි නියෝජනය කරන්නකි.

D පුරවැසි දේශපාලන සහභාගිත්වය ලද එකකි.

E සියල්ල වහල් ශ්‍රමය මත ගොඩනැගුණි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

29. වැඩවසම් රාජ්‍යය.

A රජු, පල්ලිය හා රදළයින් අතර බලය විමධ්‍යගත වූ එකකි.

B නිදහස් පුරවැසියන් නියෝජනය කළ එකකි.

C රාජාණ්ඩු යටතේ පැවති නිසා ජනතාව යටත්වැසි තත්ත්වයට පත්කළේය.

D පසුකාලයේ අත්තනෝමතික රාජාණ්ඩු ගොඩනංවන ලදී.

E රාජාණ්ඩු බලය සුජාත කළේ සම්ප්‍රදායෙනි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

30. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය,

A අධිකාරිවාදී දේශපාලන ක්‍රමයක් අනුගමනය කළේය.

B සීමිත රාජ්‍ය සංකල්පයෙන් ආරම්භ විය.

C සිය ආර්ථිකය බවට පත් කළේ මුලදී නිර්බාධවාදයයි.

D මහජන පරමාධිපත්‍ය සිය දේශපාලන විධික්‍රමය බවට පත් කළේය.

E නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය අගය කළේය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

31. සමාජවාදී රාජ්‍ය

A සිය දර්ශනය බවට පත්කරගත්තේ මාක්ස්වාදයයි

B 20 වන සියවසේ ගොඩනැංවූ රාජ්‍යයකි.

C නිර්ධනපංති ආඥා දායකත්වය මත ගොඩනැගුනි.

D බහු පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදය පිළි ගත්තකි.

E වර්තමානයේ ලිබරල් රාජ්‍යයට ප්‍රබල විකල්පයක් නොවන්නකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

32. ෆැසිස්ට් රාජ්‍යය,

A සර්වබලධාරී ආයතනයක් ලෙස ක්‍රියාත්මක වෙයි.

B සියළු මිනිසුන්ගේ සමානත්වය පිළිගනියි.

C පුද්ගලයා රාජ්‍යයට යට කළේය.

D පළමුවන හා දෙවන ලෝක යුද්ධ අතර කාලයේ ප්‍රචලිත විය.

E ජාතිවාදී යුධවාදී රාජ්‍යයකි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

33. යටත් විජිත රාජ්‍යය

A ඓතිහාසිකව වර්ධනය වන්නේ 20 වන සියවසේදීය.

B යුරෝපීය මව් රාජ්‍ය බලයට යටත් ආසියා, අප්‍රිකා හා ලතින් ඇමරිකානු රාජ්‍ය වර්ගයකි.

C විශාල භෞමික රාජ්‍ය වගර්යකි.

D ගොඩනගන්නේ මිලිටරි ක්‍රියාමාර්ග වලිනි.

E මධ්‍යගත රාජ්‍ය ව්‍යුහයකින් යුක්ත විය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

34. පශ්චාත් යටත් විජිත රාජ්‍ය,

A දෙවන ලෝක යුද්ධයෙන් පසුව අධිරාජ්‍යවාදී මව් රටවලින් නිදහස් වූ රාජ්‍යයයි.

B යටත් විජිත රාජ්‍ය ව්‍යුහය එලෙසම පවත්වාගෙන යයි.

C කල්පවත්නා ප්‍රජාතන්ත්‍රයක් ස්ථාපිත කිරීමට අසමත් වී තිබේ.

D සිවිල් හා මිලිටරි තන්ත්‍රයන්ගේ ආධිපත්‍යයට නතුවී ඇත.

E ව්‍යවස්ථානුකූල වාදය ශක්තිමත්ව ගෙනයනු ලබයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

35. නව ලිබරල් රාජ්‍ය,

A ගෝලීකරණයේ ප්‍රතිඵලමත බිහිවූවකි. B ජාත්‍යන්තර ප්‍රාග්ධන සමාගම්වල බලපෑමට ලක්වූවකි.

C පිළිගන්නේ සුභසාධකවාදයයි. D තවදුරටත් ප්‍රජාතන්ත්‍රවාදී වෙයි.

E අවම රාජ්‍ය සංකලපයෙන් යුක්තවෙයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

36. ස්වාධිපත්‍යය,

A ජාතික රාජයයට බලය ගොඩනැංවූ සංකල්පයකි.

B ඉදිරිපත් කරනු ලැබුයේ මැකියාවෙලී විසිනි.

C ජීන බෝඩැන්ට අනුව එය බෙදිය නොහැකිය.

D වර්තමානයේ එය අභියෝගයට ලක්වී ඇත.

E විදේශ ආර්ථික සංවිධාන - මානව හිමිකම් සංවිධාන වල බලපෑමට ලක් වී ඇත.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

37. පුරවැසියා

A ග්‍රීක නාගරික රාජ්‍යයේදී වහල් හිමි සක්‍රීය පිරිමියාය

B වර්තමානයේදී පොදු කටයුතු වලට සම්බන්ධවන වගකිවයුතු මිනිසාය.

C රාජ්‍යයක පුරවැසිභාවය සහිත වූ එහි හිමිකරුවාය.

D දේශපාලන අයිතීන් භුක්තිවිඳින වගකීම දරන්නාය.

E කිසිසේත්ම රාජ්‍යයට අවනත විය යුතුම නොවන පුද්ගලයාය.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

38. සමාජ ගිවිසුම්වාදය

A තෝමස් හොබ්ස් යෙදවා ගත්තේ අසහාය බලයක් ගොඩනැගීම වෙනුවෙනි.

B ජෝන් ලොක් සීමිත බලයක් වෙනුවෙන් යොදවාගත්තේය.

C ෂෝන් ෂාක් රූසෝ මහජන පරමාධිපත්‍යයක් වෙනුවෙන් යෙදවිය.

D විඥානවාදී විධික්‍රමයක් ද වෙයි.

E පසුකාලීන ලිබරල්වාදයට ද බලපාන ලදී.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

39. මාක්ස්වාදය,

A කාල්මාක්ස් හා පෙඩ්රික් එංගල්ස්ගේ දේශපාලන අදහස් මාලාවයි.

B නිර්ධන පංතියේ විමුක්ති දර්ශනයයි.

C පංති අරගලය වෙනුවෙන් ක්‍රියාත්මක වෙයි.

D සමාජවාදයේ දී රාජ්‍ය අහෝසිවන බවක් පෙන්වයි.

E ලෝක විප්ලවය වෙනුවෙන් ක්‍රියාත්මක වෙයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

40. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු,

A රටක මූලික නීතියයි.

B ආණ්ඩුව පාලනය කරන නීතියයි.

C රටේ සාමාන්‍ය ජනයා පාලනය වන නීතියයි.

D රටක දේශපාලන ගමන් දිසාව තීරණය කරන මූලධර්ම පද්ධතියයි.

E ආණ්ඩුවේ ත්‍රිවිධ බල ආයතනය වල බලය හා සීමා දක්වන මූලධර්ම මාලාවයි.

1. ABCD 2. BCDE 3. ABCE 4. ABDE 5.ACDE

❖ **අංක 41 සිට 50 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.**

41. ඒකීය ආණ්ඩුක්‍රමය

1. ස්වාධිපති බලය මධ්‍යගත කළ එකකි.
2. වර්තමානයේදී විවිධ විමධ්‍යගතකරණයන් වෙත යොමුවෙයි.
3. ව්‍යවස්ථාවෙන්ම බලය බෙදන ලද ආණ්ඩුක්‍රමයකි.
4. පළාත්පාලන ආයතන පවත්වා ගෙනයයි.
5. පාර්ලිමේන්තු පනත් වලින් ද බලය බෙදා දෙයි.

42. සන්ධීය ක්‍රමය

1. විවිධත්වය පමණක් ආරක්ෂාකළ ආණ්ඩුක්‍රමයකි.
2. විවිධත්වය තුළ එක්සත්කම ආරක්ෂාකළ ආණ්ඩුක්‍රමයකි.
3. එකිනෙකට සාපේක්ෂ ස්වායක්ත ආණ්ඩු මට්ටම් දෙකකින් යුක්තවේ.
4. මුලින්ම ගොඩනැංවූයේ ඇමරිකා එක්සත් ජනපදයේය.
5. බහුවාර්ගික සමාජයක ජාතික සංහිදියාව ගොඩනැංවීමට දායක වෙයි.

43. අර්ධ සංධීය ක්‍රමය

1. ඒකීය හා සංධීය ක්‍රම දෙකට අතරමැදි ආණ්ඩුක්‍රමයකි.
2. ඉන්දියාවේදී මධ්‍යම රජයේ බලය ඉස්මතු කිරීමට යොදාගෙන ඇත.
3. ලැයිස්තු තුනක් මගින් බලය බෙදීමෙන් ඉන්දියාවේ ක්‍රියාත්මක වෙයි.
4. ප්‍රාන්තවල බලය අතිශයින් පුලුල් කරයි.
5. ඉන්දියාවටම ආවේනික ක්‍රමයට ගොඩනැංවූ ආණ්ඩුක්‍රමයක් ලෙස සැලකේ.

44. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය
1. විධායකය හා ව්‍යවස්ථාදායකය අතර දුරස්ථ සම්බන්ධයක් ගොඩනගන ආණ්ඩුක්‍රමයකි.
2. ව්‍යවස්ථාදායකය විසින් විධායකය ගොඩනංවන ආණ්ඩුක්‍රමයකි.
3. විධායකය සත්‍ය හා නාමික ලෙස බෙදා තිබෙන ආණ්ඩුක්‍රමයකි.
4. නාමික විධායකය රාජ්‍යයේ නායකත්වය හොබවන ආණ්ඩුක්‍රමයකි.
5. කැබිනට් මණ්ඩලය පාර්ලිමේන්තුවට වගකියන ආණ්ඩුක්‍රමයකි.

45. ජනාධිපති ආණ්ඩුක්‍රමය.
1. ව්‍යවස්ථාදායකය හා විධායකය එකිනෙකින් වෙන් කර තිබෙන ආණ්ඩුක්‍රමයකි.
2. ත්‍රිවිධ බල ආයතන පුද්ගල වශයෙන් බෙදා තිබෙන ආණ්ඩුක්‍රමයකි.
3. රාජ්‍යයේ හා ආණ්ඩුවේ නායකත්වය ජනාධිපතිට හිමිකරදුන් ආණ්ඩුක්‍රමයකි.
4. ඇමරිකාවේ දී සංවරණ හා තුළන ක්‍රමය යොදවා ක්‍රියාත්මක කරන්නකි.
5. දැනට ලෝකයේ වඩාත් ප්‍රචලිත ආණ්ඩුක්‍රමයකි.

46. ලිබරල් දේශපාලන මතවාදය
1. නිර්මාණය කිරීමට තෝමස් හොබ්ස්ගේද දායකත්වය හිමිවී ඇත.
2. ගොඩනැගෙන්නේ අධිපතිවාදී පාලන ක්‍රම වලින් නිදහස්වීම උදෙසාය.
3. නිෂේධාත්මක නිදහස අගය කළේය.
4. පෝෂණය කිරීමට මාක්ස්වාදයේ ප්‍රබල දායකත්වයක් ලැබුණි.
5. පෝෂණය කිරීමට ජෝන් ලොක් හා ෂෝන් ෂාක් රූසෝ දායක විය

47. සමාජවාදී දේශපාලන මතවාදය
1. මුලින්ම ගොඩනැගෙන්නේ ධනවාදී පෞදගලික දේපල ක්‍රමයට විකල්ප පොදු දේපල ක්‍රමයක් වෙනුවෙනි.
2. විද්‍යාත්මක තත්ත්වයට පත් කළේ මාක්ස්වාදය මගිනි.
3. සමානතාවය පිළිබඳ මූලික සංකල්පය මත ගොඩනැගුනකි.
4. විප්ලවීය හා තුන්වන ලෝක මතවාදය ලෙස වර්ග වෙයි.
5. ඇමරිකානු ප්‍රංශ හා කැනේඩියානු දේශපාලනය මෙහෙයවනු ලබයි.

48. සමූහාණ්ඩුවාදය
1. රාජාණ්ඩුවාදයට එකහෙලා විරුද්ධ මතවාදයකි.
2. ජනතා පරමාධිපත්‍ය මත පදනම් වූවකි.
3. ලිබරල්වාදයට විකල්පයක් වෙයි.
4. ග්‍රීක හා රෝම යුගවල පටන් ප්‍රචලිත මතවාදයකි.
5. විසිවන සියවසේදී සක්‍රීය පුරවැසි ක්‍රියාවලිය අගය කරයි.

49. සමාජ ප්‍රජාතන්ත්‍රවාදී මතවාදය
1. ගොඩනැංවීමේ මූලික කාර්‍යභාරය සිදුකළේ එඩ්වර්ඩ් බර්න්ස්ටීන් විසිනි.
2. නූතන ලිබරල් සුබසාධන වාදයේ බලපෑම ලබා තිබුණි.
3. සිය දේශපාලන ආකෘතිය බවට පත් කරගත්තේ නිර්ධනපංති ආඥාදායකත්වයයි.
4. ධනවාදයේ සහ සමාජවාදයේ සම්මිශ්‍රණයකි.
5. ආර්ථික ක්ෂේත්‍රයේ රාජ්‍ය මැදිහත්වීම පිළිගත්තේය.

50. නිරාගමික වාදය
1. රාජ්‍ය හා ආගම එකිනෙකින් වෙන්කිරීම වෙනුවෙන් පැමිණි මතවාදයකි.
2. යුරෝපයේදී පල්ලියේ දේශපාලන අධිපතිවාදයට එරෙහිව මතුවූවකි.
3. ලිබරල් හා සමාජවාදී වශයෙන් වර්ග වෙයි.
4. සමාජයේ ආගමික කාර්ය පූර්ණ ලෙස ප්‍රතික්ෂේප කරයි.
5. බහු සංස්කෘතික සමාජවලදී මහජනයා ආගමික ආධිපත්‍ය ප්‍රතික්ෂේප කරයි.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**23 | S | II**

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018

## Third Term Test - Grade 12 - 2018

විභාග අංකය ............................ **දේශපාලන විද්‍යාව II** කාලය පැය තුනයි

- **1 සිට 20 දක්වා සියලු ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න. සම්පූර්ණ පිළිතුරකට ලකුණු 1ක් ද, අර්ධ පිළිතුරකට ලකුණු 1/2 ක් ද හිමි වේ.**
- **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරාගෙන ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න. එක් ප්‍රධාන ප්‍රශ්නයකට ලකුණු 20 ක් හිමිවේ.**

## A කොටස

**මෙහි කෙටි ප්‍රශ්න 20 ක් අන්තර්ගත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. ''දේශපාලනය'' යන්න පෞර රාජ්‍යයට සම්බන්ධ කාරණයක්ය යන ග්‍රීක අදහසේ අර්ථ දෙකක් තිබිණි. එම අර්ථ දෙක ලියන්න

    1. ....................................................................................................................

    2. ....................................................................................................................

02. දේශපාලන විද්‍යා ශික්ෂණය විසින් හදාරනු ලබන දේශපාලනය යන්න සමාජයේ පැවතීමේ විවිධ පැතිකඩ කීපයකි. ඉන් දෙකක් ලියන්න.

    1. ....................................................................................................................

    2. ....................................................................................................................

03. දේශපාලන විද්‍යාඥයින් පක්ෂ පිළිබඳව සම්ප්‍රදායිකව අධ්‍යයනය කළ කරුණු දෙකක් ලියන්න.

    1. ....................................................................................................................

    2. ....................................................................................................................

04. අයිතිවාසිකම් පිළිබඳව අදහස් ඉදිරිපත්කළ සමකාලීන දේශපාලන දාර්ශනිකයින් දෙදෙනෙක් නම් කරන්න.

    1. .................................................... 2. ....................................................

05. ලිබරල්වාදයේ ආභාෂයෙන් ගොඩනැගුණු ආයතන දෙකක් ලියන්න.

    1. .................................................... 2. ....................................................

06. පහත අධ්‍යයනය ක්ෂේත්‍ර දෙකට අදාල න්‍යායන් ලියා දක්වන්න.

    1. භෞතික වාදය....................................................................................

    2. ආර්ථික විද්‍යාව ....................................................................................

07. දේශපාලන හා සමාජ න්‍යායයේ සිවිල් සමාජය යන්නට ඇති සංකල්පිය ඉතිහාසය තුළ එය අර්ථ හයකින් භාවිතා කරයි. ඉන් දෙකක් ලියන්න.

    1. .................................................... 2. ....................................................

08. නූතන භෞමික රාජ්‍ය ප්‍රධාන අංග හතරක් යටතේ සංවිධාන ගතකොට තිබේ. ඉන් දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

09. ග්‍රීක නාගරික රාජ්‍යයට අනන්‍ය වූ අදහස් දෙකක් දක්නට ලැබේ. එම අදහස් දෙක ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

10. 1. පශ්චාත් යටත් විජිත රාජ්‍ය විශේෂ රාජ්‍ය මාදිලියක් ලෙස න්‍යායිකව තර්කයන් ගොඩනැගූ න්‍යායවේදිය නම් කරන්න.

..............................................................................................................................................

2. පශ්චාත් යටත් විජිත රාජ්‍යයේ ඇති සුවිශේෂී ලක්ෂණය ලියන්න.

..............................................................................................................................................

11. රාජ්‍ය සතු ස්වාධිපත්‍ය බලය බෙදා දැක්විය හැකි පැතිකඩ දෙක ලියන්න.

1. ............................................................................ 2. ............................................................................

12. වර්තමානයේදී රාජ්‍ය හා පුරවැසියා අතර සම්බන්ධතාවේ කැපී පෙනෙන ලක්ෂණ දෙක ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

13. ඒකීය රාජ්‍යයන්හි මාධ්‍යයේ සිට පහල මට්ටමට පරිපාලන බලය විසුරුවා හැරීම ප්‍රධාන ආකාර තුනකින් සිදුවේ. ඉන් දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

14. ජාතිකවාදය ප්‍රධාන ප්‍රවේශ තුනක් යටතේ හඳුනාගත හැකිය. ඉන් දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

15. ගැටුම්වල කාර්යය පිළිබඳ ප්‍රවේශය ප්‍රධාන පැතිකඩ දෙකකි. එම පැතිකඩ දෙක නම් කරන්න.

1. ............................................................................ 2. ............................................................................

16. ගැටුම් වර්ගකළ හැකි ප්‍රධාන ආකාර තුනෙන් දෙකක් ලියන්න.

1. ............................................................................ 2. ............................................................................

17. ගැටුම් සමතන ක්‍රියාවලියේදී ප්‍රයෝජනයට ගන්නා මූලික මාධ්‍ය දෙකක් ලියන්න.

1. ............................................................................ 2. ............................................................................

18. සීමිත ඡන්ද බලය හා සර්වජන ඡන්ද බලය හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දෙක පිළිවෙලින් ලියන්න

1. ............................................................................ 2. ............................................................................

19. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පාර්ලිමේන්තුව සකස් වූ ආයතන තුනෙන් දෙකක් ලියන්න.

1. ............................................................................ 2. ............................................................................

20. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිසම පත්කිරීමට හේතු දෙකක් ලියන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

**දේශපාලන විද්‍යාව**
**තෙවන වාර පරීක්ෂණය - 2018**
**12 ශ්‍රේණිය - II කොටස**

## B කොටස

❖ **B හා C කොටස් වලින් ප්‍රශ්න දෙක බැගින් තෝරා ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.**

01. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය ඔබ විග්‍රහ කරන්නේ කෙසේද? (20)

02. පහත මාතෘකා දෙකක් විභාග කරන්න
1. දාර්ශනික ප්‍රතිමානිය ප්‍රවේශය
2. තුලනාත්මක ප්‍රවේශය
3. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය
4. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය (10 x 2 = 20)

03. පහත මාතෘකා දෙකක් පිළිබඳ විමසීමක යෙදෙන්න.
1. ගෝලීයකරණය හා රාජ්‍ය
2. නූතන භෞමික රාජ්‍යය
3. නූතන ජාතික රාජ්‍යය. (10 x 2 = 20)

04. පහත මාතෘකා දෙකක් විභාග කරන්න.
1. රාජ්‍ය හා ස්වාධිපත්‍ය
2. රාජ්‍ය හා පුරවැසියා
3. සමාජ සම්මුතිවාදය
4. ස්ත්‍රී වාදය (10 x 2 = 20)

## C කොටස

05. ඒකීය ආණ්ඩුක්‍රමයක් සන්ධීය ආණ්ඩුක්‍රමයකින් වෙනස් වන්නේ කෙසේද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.(20)

06. පහත මාතෘකා විමසන්න.
1. සමූහාණ්ඩුවාදය
2. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
3. ජාතික වාදය
4. නිරාගමික වාදය (10 x 2 = 20)

07. ගැටුම් ආශ්‍රිතව පහත මාතෘකා දෙකක් පිළිබඳ විධිමත් විමසුමක යෙදෙන්න.
1. ගැටුම් වර්ගීකරණය
2. ගැටුම්වල ජීවන චක්‍රය
3. ගැටුම් සමතන ක්‍රියාවලිය (10 x 2 = 20)

08. 1833 කොල්බෲක් ආණ්ඩුක්‍රමය ආශ්‍රිතව ලැබුනු සමාජ ආර්ථික දේශපාලන ප්‍රතිඵල පිළිබඳ විචාරාත්මක විමසීමක යෙදෙන්න. (ලකුණු 20)

## තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2018 - දේශපාලන විද්‍යාව

**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 4 | **11.** - 3 | **21.** - 5 | **31.** - 3 | **41.** - 3 |
| **02.** - 1 | **12.** - 2 | **22.** - 4 | **32.** - 5 | **42.** - 1 |
| **03.** - 2 | **13.** - 1 | **23.** - 1 | **33.** - 2 | **43.** - 4 |
| **04.** - 5 | **14.** - 1 | **24.** - 4 | **34.** - 1 | **44.** - 1 |
| **05.** - 1 | **15.** - 2 | **25.** - 3 | **35.** - 4 | **45.** - 5 |
| **06.** - 2 | **16.** - 3 | **26.** - 1 | **36.** - 5 | **46.** - 4 |
| **07.** - 4 | **17.** - 5 | **27.** - 4 | **37.** - 1 | **47.** - 5 |
| **08.** - 3 | **18.** - 1 | **28.** - 5 | **38.** - 3 | **48.** - 3 |
| **09.** - 2 | **19.** - 5 | **29.** - 5 | **39.** - 3 | **49.** - 3 |
| **10.** - 4 | **20.** - 3 | **30.** - 2 | **40.** - 4 | **50.** - 4 |

## දේශපාලන විද්‍යාව II පිළිතුරු
## A කොටස

01. 1. රාජ්‍ය හා රාජ්‍ය පාලනයට සම්බන්ධ කාරනා
    2. රාජ්‍ය කටයුතු සම්බන්ධව පුරවැසියන්ගේ කාර්යභාරය හා ක්‍රියාකාරීත්වය

02. දේශපාලන ආයතන, දේශපාලන භාවිත, ආණ්ඩුකරණය, දේශපාලන චර්යාව, දේශපාලන මතවාද

03. පක්ෂ වැඩපිළිවෙල, මැතිවරණ ප්‍රකාශන, පක්ෂවල ඉතිහාසය ආදී....

04. ජෝන් රෝල්ස්, රොනල් ඩ්වොගින්, අයිසයා බර්ලින්

05. පාර්ලිමේන්තුව, ජනමාධ්‍ය, නිදහස් අධිකරණය, සීමිත බලතල සහිත ආණ්ඩුව

06. 1. ගුරුත්වාකර්ශන න්‍යාය    2. ඉල්ලුම් සැපයුම් න්‍යාය

07. සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය, සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය, සංගමික ප්‍රජාතන්ත්‍රවාදී අර්ථය ..... ආදී

08. නිශ්චිත දේශ සීමාව, ජාතික පදනම, ආණ්ඩුව, ස්වාධීපත්‍ය

09. 01 - නාගරික රාජ්‍ය දේශපාලන වශයෙන් සංවිධානය වූ එකක් වීම
    02 - ඒවා එකිනෙකින් ස්වාධීන වූ ඒකක වීම.

10. 1. හම්සා අලාවි
    2. ශක්තිමත් හා බලසම්පන්න මිලිටරි සහ සිවිල් නිලධර ව්‍යුහය රාජ්‍ය තන්ත්‍රයේ කේන්ද්‍රීය ආයතනය ලෙස කටයුතු කිරීම.

11. අභ්‍යන්තර හා බාහිර

12. 1. පුරවැසියන් බුක්ති විඳින දේශපාලන අයිතිවාසිකම්.
    2. පුරවැසියන්ගේ දේශපාලන වගකීම

13. බලය විතැන් කිරීම, පරිපාලන විමධ්‍යගත කිරීම, බලය පැවරීම

14. නූතනවාදී ප්‍රවේශය, චිරන්තනවාදී ප්‍රවේශය, මෙවලම්වාදී ප්‍රවේශය

15. ගැටුම් සාධනීය පැතිකඩ, ගැටුම්වල නිශේධනීය පැතිකඩ

16. සරල වර්ගීකරණය, කෘත්‍යවේදී වර්ගීකරණය, දේශපාලන වර්ගීකරණය

17. සහ මන්ත්‍රණය, මැදිහත්කරණය, සාම ගිවිසුම, සාමය ගොඩනැගීම

18. 1. කෘෘව් මැකලම් ආණ්ඩුක්‍රමය    2. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

19. 1. රැජිණ 2. නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 3. සෙනෙට් මණ්ඩලය

20. 1. දේශපාලන අතපෙවීම් වලින් රාජ්‍ය සේවය ආරක්‍ෂා කර ගැනීමට

2. රාජ්‍ය සේවය පිළිබඳ බහුතර කණ්ඩායම් අතර විශ්වාසය ගොඩනැගීමට

## B කොටස

01. දේශපාලනය කිරීම හා දේශපාලනය හැදෑරීම පිළිබඳ විග්‍රහ කර තිබීම. (ලකුණු 20)

02. 1. දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශ හඳුන්වා එහි මූලික ලක්‍ෂණ පිළිබඳව විග්‍රහ කිරීම.

2. තුලනාත්මක ප්‍රවේශය හඳුන්වා තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ධාරා විමසුමට ලක්කර තිබිම

3. දේශපාලන අර්ථශාස්ත්‍රීය ප්‍රවේශය හඳුන්වා එහි ප්‍රධාන න්‍යායික අංගෝපාංග විමසුමට ලක්කිරීම.

4. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුන්වා ඒ පිළිබඳ විමසීමක යෙදීම (10 x 2 = 20)

03. 1. ගෝලීයකරණය හඳුන්වා එය රාජ්‍යයට බලපෑම් කරන ආකාරයත් ඒ පිළිබඳ න්‍යායික ප්‍රවේශයත් විමසුමට ලක්කිරීම.

2. නූතන භෞමික රාජ්‍ය පිළිබඳ හඳුන්වා එහි ප්‍රධාන අංග පිළිබඳ විමසීමට ලක් කිරීම.

3. ජාතික රාජ්‍ය යන්න අර්ථ දක්වා එහි දැකිය හැකි ලක්‍ෂණ පිළිබඳව විමසුමක යෙදීම. (10 x 2 = 20)

04. 1. ස්වාධිපත්‍ය යන්න හඳුන්වා එය රාජ්‍ය තුළ දක්නට ලැබෙන ආකාරය විමසුමට ලක් කිරීම.

2. පුරවැසියා යන්න අර්ථ දක්වා ඔහු රාජ්‍ය හා සම්බන්ධ වන ආකාරය විමසුමට ලක් කිරීම.

3. සමාජ සම්මුතිවාදයට හඳුන්වා එය ඉදිරිපත් කළ චින්තකයින්ගේ අදහස් විමසුමට ලක් කිමට

(තෝමස් හොබ්ස්, ජොන් ලොක්, ෂෝන් ෂාක් රූසෝ)

4. ස්ත්‍රීවාදය හඳුන්වා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ විමසීමට ලක්කිරීම (10 x 2 = 20)

## C කොටස

05. ඒකීය ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණ හා සන්ධීය ආණ්ඩුක්‍රමයක ලක්‍ෂණ ඒවා එකිනෙකින් වෙනස්වන ආකාරය පිළිබඳ විචාරශීලී විග්‍රහයක යෙදීම. (ලකුණු 20)

06. 1. සමූහාණ්ඩුවාදය හඳුන්වා එහි ලක්‍ෂණ වර්ධන අවධි පොදු හරාත්මක මූලධර්ම ආදිය පිළිබඳ විමර්ශනයක යෙදීම

2. වර්තමාන මතවාදයක් ලෙස සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ ඇති වැදගත්කම හා එහි දැකිය හැකි ලක්‍ෂණ විමසුමට ලක්කිරීම

3. 19 හා 20 වන සියවස්වල වර්ධනය වූ ප්‍රධානතම දේශපාලන මතවාදයක් ලෙස ජාතිකවාදයේ ඇති වැදගත්කම විමර්ශනයට ලක් කිරීම.

4. නිරාගමිකවාදය හඳුන්වා එහි සම්භවය හා මූලධර්ම විමසුමට ලක්කිරීම (10 x 2 = 20)

07. 1. ගැටුම් වර්ගීකරණය ආකාර තුනකට සිදුකළ හැකි බව විග්‍රහ කරමින් ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.

2. ගැටුම් වල ජීවන චක්‍රය දක්වා එහි විවිධ අවස්ථාවන් විමසුමට ලක්කිරීම

3. ගැටුම් සමතන ක්‍රියාවලිය හඳුන්වා එම ක්‍රියාවලිය විස්තරාත්මකව විග්‍රහ කිරීම.

(10 x 2 = 20)

08. 1833ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනය සිදුවූ ආකාරය, එමගින් ලැබුන ආර්ථික, සාමාජිය, දේශපාලනික ප්‍රතිඵල පිළිබඳ විචාරාත්මකව විමසුමක යෙදීම. (ලකුණු 20)